වාවකච්චේරිය නගර සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 22 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 27 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 17 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වාවකච්චේරිය නගර සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරිය නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) වත්කම්, වගකීම් සහ ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| <u>මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම</u> | <u>වත්කම්</u> | | <u>වගකීම්</u> | | <u>ආදායම්</u> | |
|---|---|---|---|---|---|---|
| | <u>අවස්ථා සංඛ්‍යාව</u> | <u>වටිනාකම</u> | <u>අවස්ථා සංඛ්‍යාව</u> | <u>වටිනාකම</u> | <u>අවස්ථා සංඛ්‍යාව</u> | <u>වටිනාකම</u> |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | - | - | 06 | 483,069 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 241,156 | - | - | - | - |
| අත්හැරීම් | - | - | 01 | 953,741 | - | - |

(ආ) රජයෙන් සහ රාජ්‍ය නොවන සංවිධාන වලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 08 ක් අගය කර ගිනුම් ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------------

පාලන ගිණුම් අනුව සමහර ගිනුම් විෂයයන්ගේ ශේෂය රු.7,582,680 ක් වු අතර උපකාරක ලේඛන අනුව එම ගිණුම් වල ශේෂයන්ගේ එකතුව රු.7,461,760 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------------

අවශ්‍යා තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.338,155,135 ක් වු ගනුදෙනු 05 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්මවු පුනරාවර්ථන වියදම් අතිරික්තය රු.18,043,728 ක් වු අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අදායම ඉක්මවු පුනරාවර්ථන වියදම් අතිරික්තය රු.7,178,162 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් අයවැයගත සහ තථ්‍ය ආදායම් අතර රු.5,287,216 ක වෙනසක් නිරික්ෂණය වූ අතර අයවැයගත හා තථ්‍ය වියදම් අතර රු.9,769,180 ක වෙනසක් නිරික්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව දක්නට ලැබිණි.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

---------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 1,271 | 962 | 4,746 |
| බදුකුලී | 13,501 | 13,899 | 534 |
| බලපත්‍ර ගාස්තු | 769 | 638 | - |
| වෙනත් ආදායම් | 51,678 | 57,007 | 32,366 |

2.3.2 ආදායම් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 10 කට අධික කාලයක් හිඟ හිටි රු.9,769,180 ක් වූ වෙළඳ පොළ බදු, කුලී සහ වෙළඳ බලපත්‍ර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සභාවට අයවිය යුතු රු.4,745,583 ක් වූ පරිපනම් සහ බදු අයකර ගැනිම සඳහා නිසි/නීතිමය පියවර ගෙන නොතිබුණි

2.3.3 ආදායම් අහිමි වීම

--------------------------

1999 වර්ෂය තුලදී සභා බල ප්‍රදේශය තුල වීථි ලාම්පු නඩත්තුව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල වීථි ලාම්පු නඩත්තුව සඳහා සභාව විසින් දරන ලද රු.424,210 ක් වූ වියදම් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනිමට නොහැකිව තිබුණු බැවින් එය සභාවට පාඩුවක් වි තිබුණි.

2.3.4 උසාවි දඩ

--------------

නීති ගණනාවක් යටතේ 2012 වර්ෂය සඳහා මහේස්ත්‍රාත් උසාවි වලින් ලැබිය යුතු උසාවි දඩ වර්ෂයේ ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

------------------

2006, 2007, 2010, 2011 සහ 2012 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.31,073,207 ක් වූ මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | හිඟ මුද්දර ගාස්තු |
|---|---|
| | රු. |
| 2006 | 1,158,415 |
| 2007 | 1,513,430 |
| 2010 | 4,772,100 |
| 2011 | 11,796,117 |
| 2012 | 11,833,145 |
| | 31,073,207 |
| | ========= |

2.4 වත්කම් කළමනාකරණය

---------------------------------

2.4.1 ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය

--------------------------------------

නිලධාරින් 26 දෙනෙකුගෙන් අයවිය යුතු රු.121,946 ක් වූ කාර්ය මණ්ඩල ණය ශේෂ වර්ෂ 05 කට අධික කාලයක් පුරා හිඟ හිට තිබුණි. කෙසේ වුවද ඉහත ශේෂයන් ඇපකරුවන්ගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4.2 වාර්ෂික සමික්ෂණ මණ්ඩල වාර්තාව

------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල පවත්වන ලද වාර්ෂික සමික්ෂණ මණ්ඩලය වෙත දෙමළ පොත් 83 ක් සහ ඉංග්‍රීසි පොත් 09 ක් ඉදිරිපත් කිරිමට සභාව අපොහොසත් වි තිබුණි.

2.5 අනුකූල නොවීම්

----------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවිම් විගණනයේදි නිරික්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදායට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | - | මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂ 02 ක් ඉක්ම වූ රු.295,296 ක් වූ විවිධ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | උතුරු පළාත් සභාවේ මුදල් රීති අංක 101 සහ 102 | - | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ ත්‍රෛයිමාසික විගණන වාර්තා සභාව විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

2.6 අවිධිමත් ගෙවීම්

---------------------

2012 අප්‍රේල් මාසයේදි සභා අරමුදලෙන් රු.504,980 කට ත්‍රිරෝද රථයක් මිලදී ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදි සභා අරමුදලෙන් රු.13,500 ක් වූ වාහන කුලී ගාස්තු ගෙවා තිබුණි.

2.7 මතභේදයට තුඩුදෙන ගෙවීම්

------------------------------------

ජාත්‍යාන්තර කාන්තා දිනය සහ පළාත් පාලන සතියට අදාලව නාට්‍යයක් සහ ඡායාරූප ගැනීම වෙනුවෙන් සභා අරමුදලෙන් රු.86,610 ක් ගෙවා තිබුණි.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------------

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරිම පිණිස අයවැයට ඇතුළත් කරන ලද වටිනාකම රු.9,964,815 ක් වූ ප්‍රාග්ධන වැඩ 06 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වුවද ඉදිරි කාල පරිඡේදයකදි එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් අත්හැර දමන ලද ව්‍යාපෘති

------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයට ඇතුළත් කරන ලද වටිනාකම රු.3,100,000 ක් වූ ප්‍රාග්ධන වැඩ 02 ක් සම්පූර්ණ නොකොට අත්හැර දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමෙහි රු.1,554,385 ක් තැන්පත් කර තිබුණි. වැඩ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අත්හැර දමන ලද ව්‍යාපෘතිය | ඇස්තමේන්තු කළ මුදල |
|---|---|
| | රු. |
| පලෙයියාඩි විනයාගර් මාර්ගය | 800,000 |
| වෙළඳපොළ සාප්පු සංකීර්ණය | 2,300,000 |
| | 3,100,000 |
| | ======== |

2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2010-2011 වර්ෂයේදී ප්‍රජා ශාලාව සඳහා පරිත්‍යාග කරන ලද රු.10,000 ක් ප්‍රජා ශාලාව සඳහා මුදා නොහැර විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ආ) වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ විවිධ ණයහිමි ගිණුමෙහි ඇතුළත්ව තිබූ රු.291,644 ක මුදලක් මෙම වාර්තාවේ දිනය දක්වා ගෙවා නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගන්නා ලද රු.32,815 ක් වුරුඳවූම් බදු කොන්ත්‍රාත්කරුවන්ට නොගෙවා විවිධ තැන්පතු ගිණුමෙහි තබාගෙන තිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙනුවෙන් සේවකයන්ගෙන් අයකර ගන්නා ලද පිළිවෙලින් රු.538,910 ක සහ රු.80,837 ක් මෙම වාර්තාවේ දිනය දක්වා සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ අධ්‍යක්ෂවරුන් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

-------------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i.) ආදායම් රැස්කිරිම

(ii.) ආපසු නොගෙවන විවිධ තැන්පතු

(iii.) ගිණුම්කරණය

(iv.) මානව සම්පත් කළමනාකරණය

(v.) ප්‍රදාන

(vi.) ස්ථාවර වත්කම්